**කැලණිය විශ්වවිද්‍යාලය - 2023**

**-------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

**කැලණිය විශ්වවිද්‍යාලයේ** 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලය මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (අ) | (i) මුදල් රෙගුලාසි 371 | අවස්ථා 48 කදී ලබාදී තිබුණු එකතු වටිනාකම රු.7,551,320 ක් වූ අත්තිකාරම් පියවා නොතිබුණි. | නොපියවූ සැපයුම් හා සේවා අත්තිකාරම් කඩිනමින් පියවා ගැනීම සඳහා කටයුතු සිදු කරමින් පවතින බව. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| | (ii) මුදල් රෙගුලාසි 571 | වසර 2කට වැඩි කාලයක සිට පවතින ටෙන්ඩර් තැන්පතු හා ආරක්ෂක තැන්පතු රු 14,096,353.ක් ද වසර 5 කට වැඩි කාලයක සිට පවතින පුස්තකාල තැන්පතු රු9,536,491.ක් ද නියාදනය කර නොතිබුණි. | ටෙන්ඩර් හා ආරක්ෂක තැන්පතු අදාළ අංශවල අධීක්ෂණයට යොමුකර ඇති බව හා වර්ෂ 05 ඉක්මවූ ආපසු ගෙවිය යුතු පුස්තකාල තැන්පතුවල වටිනාකම 2024 වර්ෂයේ ආදායමට ගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2014 පෙබරවාරි 11දිනැති අංක 2014/02දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 04(ii) වගන්තිය | අන්තර් පර්යේෂණ වාර්තා ඉදිරිපත් නොකළ ආචාර්යවරුන් 31 දෙනෙකු වෙත සමාලෝචිත වර්ෂය තුළ පර්යේෂණ දීමනා වශයෙන් රු.11,382,909 ක් ගෙවා තිබුණි. | පර්යේෂණ ආරම්භ කළ දින සිට මාස 06 ක් තුළ ප්‍රගතිය ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වන කොන්දේසියට විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සංගමය දැඩි ලෙස විරුද්ධ වූ අතර එම දීමනාව ප්‍රදානයක් නොව වැටුපේ කොටසක් බව උපකුලපති වෙත දැනුම්දී ඇති බව. | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,322,233,673 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.3,613,377,751 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,291,144,078 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂයේ මුළු වියදම වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අවශ්‍යතාවය නිවැරදිව හඳුනා ගැනීමකින් තොරව 2012 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී මිලදීගෙන තිබුණු ලිපි ද්‍රව්‍ය හා නඩත්තු ද්‍රව්‍ය හා භාණ්ඩවලින් 2023දෙසැම්බර් 31දිනට චලනය නොවන භාණ්ඩ තොගවල වටිනාකම රු 5,736,393.ක්ද සෙමින් චලනය වන භාණ්ඩ තොගවල වටිනාකම රු 1,334,240.ක්ද හානිවූ තොග වටිනාකම රු 401,834.ක්ද විය. | පරීක්ෂණ කමිටුවක් පත්කර ඇති අතර එහි නිර්දේශ අනුව කටයුතු කරන බව. | අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගෙන ද්‍රව්‍ය මිලදී ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31දිනට ශිෂ්‍යත්ව හා ත්‍යාග අරමුදල් ආයෝජනයෙන් ලැබී තිබුණු එකතුව රු 18,995,650.ක් වූ පොළී ආදායම අදාළ අරමුණු වෙනුවෙන් වැය නොකර ඌන උපයෝජිතව පැවතුණි. | අරමුදල් උපයෝජනය වැඩි කිරීමට අවශ්‍ය සියළු ක්‍රියාමාර්ග ගැනීමට විශ්වවිද්‍යාලය කටයුතු කරන බව. | අරමුදල් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය. |

### 3.3 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020අගෝස්තු 10දින ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණු මහල් 4කින් යුතු හෙට්ටියාවත්ත පඤ්ඤාරාම නේවාසිකාගාර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු විශ්වවිද්‍යාලය හා කොන්ත්‍රාත්කරුගේ පාලනයෙන් බැහැර හේතු මත අවසන් කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (යටිතල පහසුකම් සංවර්ධන) | කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කරන තෙක් දැරූ වියදම් කෙරීගෙන යන වැඩ ගිණුමෙහි දක්වා ඇති බව. | සිසුන්ට නේවාසික පහසුකම් සැලසීම සඳහා ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිම කර ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත |

| | |
|---|---|
| ගේ 2021 ජූනි 21 දිනැති ලිපිය මගින් උපදෙස් ලබා දී තිබුණි. ඒ අනුව දෙපාර්ශවයේ එකඟතාවයෙන් කොන්ත්‍රාත්තුව අතරමග අවසන් කිරීමට කටයුතු කිරීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු වෙත රු.4,029,430ක් අමතරව ගෙවීමට සිදුව තිබුණි. එමෙන්ම, 2023 වර්ෂය අවසන් වන විටත් සිසුන් සඳහා අවශ්‍ය නේවාසිකාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට කටයුතු කර නොතිබුණු අතර වැයකර තිබුණු රු.65,457,463ක් නිෂ්ඵල වියදමක් වී තිබුණි. | යුතුය. |

**3.4 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රධාන ආරක්ෂක නිලධාරී විසින් 2021 නොවැම්බර් 30 දින මුරකුටි 9ක අවශ්‍යතාවයක් ඉදිරිපත් කර වසරකටත් අඩු කාලයක් තුළ තවත් මුරකුටි 8ක අවශ්‍යතාවයක් ඉදිරිපත් කර තිබුණි. පළමු ප්‍රසම්පාදනයේදී මුරකුටියක පිරිවැය රු.276,000ක් වුවත් දෙවන ප්‍රසම්පාදනයේදී එය රු.521,000 ක් දක්වා වැඩි වී තිබීමෙන් දෙවන වර ඉදිකරන ලද මුරකුටි 7 ක් සඳහා රු.1,715,000 ක් වැඩිපුර වැය කිරීමට සිදුවී තිබුණි. එමෙන්ම මුරකුටිවල ගැල්වනයිස් තහඩු වල ඝනත්වය අපේක්ෂිත පිරිවිතර වලට වෙනස්ව පැවතුණි. | මුරකුටි 20ක අවශ්‍යතාව පැවතියද මූල්‍ය දුෂ්කරතා නිසා පළමුව මුරකුටි 09ක් හා පසුව මුරකුටි 08ක් මිලදී ගත් බව හා වැඩ ඉංජිනේරුගේ නිර්දේශය මත ගෙවීම් සිදුකළ බව. | උපරිම ආර්ථික වාසි සැලසෙන අයුරින් ප්‍රසම්පාදන කටයුතු සිදුකළ යුතු අතර පිරිවිතර වලට අනුකූල භාණ්ඩ පමණක් මිලදී ගත යුතුය. |

**3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාණිජ හා කළමනාකරණ පීඨයට මහල් 10කින් යුතු පීඨ ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කර්මාන්තය සඳහා උපදේශන සේවා සපයන ආයතනය වෙනුවෙන් 2020 සහ 2021 වර්ෂවලදී එකතුව රු.15,013,437ක් උපදේශන සේවා ගාස්තු ලෙස ගෙවා තිබුණ ද, ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2023 දෙසැම්බර් 31 දක්වාම ආරම්භ කර නොතිබුණි. | ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 හා 04/2022 අනුව රජයේ ඉදිකිරීම් කටයුතු නවතා දමන ලෙස උපදෙස් ලබාදී ඇති බැවින් අදාළ කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් කටයුතු නවතා ඇති බව. | අදාළ අනුමැතිය ලබාගෙන ගොඩනැගිල්ලේඉදි කිරීම් කටයුතු ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31දිනට විශ්වවිද්‍යාලයේ අධ්‍යයන පීඨ 6සඳහා අනුමත ස්ථිර අධ්‍යයන කාර්යමණ්ඩලය 829 ක් වුවද තත්‍ය කාර්යමණ්ඩලය690 ක් වූ අතර ඉන් 125 දෙනකු සප්ත වාර්ෂික නිවාඩු හා අධ්‍යයන නිවාඩු ලබාගෙන තිබුණි. එමනිසා විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථයින් 15310 කට සක්‍රීය ලෙස අධ්‍යයන කටයුතු සිදු කිරීමට හා විෂය නිර්දේශ ආවරණය කිරීමට බාහිර දේශකයින්ගේ සහය ලබා ගෙන සමාලෝචිත වර්ෂය සඳහා පමණක් රු.36,105,195 ක් බාහිර දේශක ගාස්තු ලෙස ගෙවා තිබුණු අතර එය 2022 වර්ෂයට සාපේක්ෂව සියයට 28 ක වැඩිවීමක් විය. | සිසුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා බාධාවන් නොවන පරිදි හැකිතාක් දුරට සප්ත වාර්ෂික හා අධ්‍යයන නිවාඩු ලබාදීම සිදුකරන බව. | සිසුන්ගේ අධ්‍යාපන කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් අධ්‍යයන කාර්ය මණ්ඩලයක් පවත්වාගත යුතුය. |